**සැ. යු. -** 2020.08.21 වැනි දින පළ වූ අංක 2190 දරන ගැසට් පත්‍රයේ II සහ IV (අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,191 - 2020 අගෝස්තු මස 28 වැනි සිකුරාදා - 2020.08.28**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| රජයේ නිවේදන ... ... ... | 884 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 884 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2020 සැප්තැම්බර් මස 18 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2020 සැප්තැම්බර් මස 04 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2020 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# රජයේ නිවේදන

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### කොළඹ මහ නගර සභාවට අයත් ලේඛන ලියාපදිංචි කිරීම

ලේඛන ලියාපදිංචි කිරීම මහජනතාවට පහසුවෙන් හා කඩිනමින් ඉටුකරලීමේ අරමුණෙන් කොළඹ මහ නගර සභා සීමාවට අයත් ප්‍රදේශවල ලේඛන ලියාපදිංචි කිරීමට භාරගැනීම සඳහා කොළඹ 07 ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයට අනුබද්ධව කොළඹ මහ නගර සභා පරිශ්‍රය තුළ ලේඛන භාරගැනීමේ කවුළුවක් 2020 මාර්තු මස 10 වැනි දින සිට ස්ථාපනය කර ඇත.

තිඹිරිගස්යාය සහ කොළඹ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස බල ප්‍රදේශයන්හි පිහිටි දේපළ සම්බන්ධ ලේඛන මේ යටතේ ලියාපදිංචිය සඳහා භාරදිය හැකි ය.

රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

08 - 619

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### 2010 අංක 19 දරන මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) පනත

**ජාතික ව්‍යසන පාත්‍ර ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම**

2010 අංක 19 දරන මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) පනතේ II වැනි කොටසේ 9 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාර, බදුල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ, හාලිඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැදගම ග්‍රාම නිලධාරි වසම 2014.12.26 වැනි දින සිදු වූ නාය යාම හේතුවෙන් හානියට පත් "ජාතික ව්‍යවසන පාත්‍ර ප්‍රදේශයක්" ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරමි.

එන්. සී. විතානගේ,
රෙජිස්ට්‍රාර් ජනරාල්,

2020 ජූලි මස 27 වැනි දින,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ 3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

08 - 624

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## හැටන් නැෂනල් බැංක් පීඑල්සී - දඹුල්ල ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැංක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතයයි

දොන් මැනුවෙල් සාගර සුමිත් කුමාර.

2020 මාර්තු මස 04 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමකදී පහත දැක්වෙන පරිදි විශේෂයෙන් හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට ප්‍රසිද්ධ නොතාරිස් යූ. එස්. කේ. හේරත් විසින් ලියා සහතික කරන ලද අංක 5523 හා 2016.05.11 වැනි දින දරන බැඳුම්කරය සහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. ආර්. ජයවර්ධන විසින් ලියා සහතික කරන ලද අංක 13735 හා 2018.12.28 වැනි දින දරන බැඳුම්කරය මත ගෙවිය යුතු මුදල් ගෙවීම ණයකරු වශයෙන් දොන් මැනුවෙල් සාගර සුමිත් කුමාර විසින් පැහැර හැර ඇති අතර, ඒ අනුව, එකී බැඳුම්කර මත 2019.10.31 වැනි දිනට රුපියල් මිලියන දොළහයි නම ලක්ෂ හැත්තෑ පන් දහස් අටසිය දෙකයි ශත තුනක (රු. 12,975,802.03) මුදලක් දූන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ගෙවිය යුතුව සහ අයවිය යුතුව ඇති අතර, ඒ අනුව 2019.11.01 වැනි දින සිට විකුණුම් දිනය දක්වා තවදුරටත් පොළිය සමග රුපියල් මිලියන දොළහයි නම ලක්ෂ හැත්තෑ පන් දහස් අටසිය දෙකයි ශත තුනක (රු. 12,975,802.03) එකී මුදල සහ ප්‍රචාරණ පිරිවැය සහ එතෙක් ගෙවා ඇති යම් මුදලක් (ඇත්නම්) අඩුකොට අයකර ගැනීම සඳහා එකී අංක 5523 සහ 13735 දරන බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස්කරන ලද සහ මෙහි උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ සහ පරිශ්‍රය, මුළු දිවයිනටම බලයලත් වෙන්දේසිකරු පී. මුතුකුමාරණ මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් මෙමගින් යෝජනා සම්මත කර ගනී.

### පළමුවන උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සහ මහනගර සභා සීමාව තුළ පල්ලේ පත්තුවේ, සල්පිටි කෝරළේ, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සහ මිලාගිරිය ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ මිලාගිරිය කොට්ඨාස අංක 39හි බම්බලපිටියේ, නිමල් පාර ඔස්සේ පිහිටි නිමල් පාර, වරිපනම් අංක 1 5/2 දරන 5 වන මහලේ පිහිටි බලයලත් මිනින්දෝරු එස්. ක්‍රිෂ්ණපිල්ලෙයි විසින් සාදන ලද අංක 3690 හා 2015 මාර්තු මස 18 වැනි දින දරන සහාධිත්‍ය පිඹුරේ එෆ්5පී2 වශයෙන් දැක්වෙන නේවාසික සහාධිපත්‍ය ඒකකයට මායිම් වශයෙන්, උතුරට : මෙම සහාධිපත්‍ය ඒකකය සහ සීඊ3, සීඊ1, සීඊ2 සහ සීඊ4 අතර බිත්තියේ මධ්‍ය ද, නැගෙනහිරට : මෙම සහාධිපත්‍ය ඒකකය සහ සීඊ2, සීඊ 4 අතර බිත්තියේ මධ්‍ය සහ මෙම සහාධිපතය ඒකකය පැසේජයෙන් වෙන් කරන බිත්තියේ මධ්‍ය ද, දකුණට : මෙම සහාධිපත්‍ය ඒකකය සහ සීඊ4 සහ සීඊ5 අතර බිත්තියේ මධ්‍ය ද, බස්නාහිරට : මෙම සහාධිපත්‍ය ඒකකය සහ සීපීඑෆ්5පී1, සීඊ3, සීඊ14 (එස්ඩබ්), සීඊ 15 (සෝපානය) සහ සීඊ20 අතර බිත්තියේ මධ්‍ය, පහළට : සීපීඑෆ්4පී2ට ඉහළින් පිහිටි මෙම සහාධිපත්‍ය ඒකකයේ කොන්ක්‍රීට් පොළවේ මධ්‍යයද, මුදුනට : මෙම සහාධිපත්‍ය ඒකකය ඉහළ පිහිටි කොන්ක්‍රීට් වහළ වේ.

අංක 3690 දරන එකී සහාධිපත්‍ය පිඹුරට අනුව විශාලත්වය වර්ග මීටර් අසූ අටයි දශම දෙකයි හය (වර්ග මීටර් 88.26) එනම් වර්ග අඩි නමසිය පනහ (වර්ග අඩි 950)ක් වූ බිම් කොටස වේ.

එෆ්5පී2 දරන සහාධිපත්‍ය ඒකකයට ඉක්මනින්ම ප්‍රවේශ විය හැකි පොදු ප්‍රදේශය, සීඊ20 වේ.

සහාධිපත්‍ය දේපළේ පොදු උපාංගවල මෙම සහාධිපත්‍ය ඒකකයේ නොබෙදූ කොටස් වටිනාකම, 8.44% වේ.

බිම් මහලේ රථගාල ද සමග වේ.

### දෙවන උපලේඛනය

බලයලත් මිනින්දෝරු එස්. ක්‍රිෂ්ණපිල්ලෙයි විසින් සාදන ලද අංක 3690 හා 2015 මාර්තු මස 18 වැනි දින දරන එකී සහාධිපත්‍ය පිඹුරේ නිරූපණය කර ඇති සහ විස්තර කර ඇති පොදු උපාංග වන ඉඩම සහ ගොඩනැගිල්ලට අනුබද්ධ කොටස්.

1982 අංක 45 දරන (සංශෝධන) පනතේ 12 වන වගන්තිය මගින් සංශෝධනය කරන ලද පරිදි, 1973 අංක 11 දරන බද්ද නිවාස අයිතිකම් නීතියේ 26වන වගන්තියේ දක්වා ඇති පරිදි, සහාධිපතය දේපළේ ව්‍යවස්ථාපිත පොදු උපාංග

1. සහාධිපතය දේපළට අයත් විවෘත අවකාශයන් ඇතුළුව, ගොඩනැගිල්ල පිහිටා ඇති ඉඩම.

2. ගොඩනැගිල්ලේ අත්තිවාරම, කණු, ජාලක, බාල්ක, ආධාරක. ප්‍රධාන බිත්ති, ප්‍රවේශ ශාලා, පඩිපෙල්, ගින්නක් ඇති වූ විට පිටවෙන පඩිපෙල සහ වහල.

3. විදුලිය, දුරකථන, ගුවන් විදුලි, විසිරුවා හැරීම්, රූපවාහිනි, ජල පයිප්ප, ජල ටැංකි, වතුර වළවල්, ඉහළ පිහිටි ජල ටැංකි, පොම්පාගාරය, නළ මාර්ග, කසල මාර්ග, කාණු කවාට සහ කසළ බැහැර කිරීම වැනි මධ්‍යම සේවාවන් සඳහා සවිකිරීම්.

4. දේපළේ පැවැත්ම. නඩත්තුව සහ ආරක්ෂාව සඳහා අවශ්‍යවන හෝ පහසුවන හෝ සාමාන්‍යයෙන් පොදුවේ පාවිච්චි කරන, දේපළේ අනෙකුත් සියලුම කොටස් සහ පහසුකම්.

(II) සහාධිපත්‍ය පිඹුරේ ලකුණු කර ඇති සහ විස්තර කර ඇති ප්‍රදේශවන, පොදු උපාංගවල නිර්වචන සහ විස්තර

සීඊ1 : (ඒ) එය ඉදිරිපස ඉඩම සහ විවෘත අවකාශයයි
(බී) වාතාශ්‍රය සඳහා විවෘත අවකාශය
(සී) ප්‍රවේශය සහ මාර්ගය වශයෙන්, සියලුම සහාධිපතය ඒකක විසින් පොදුවේ පාවිච්චි කිරීම සඳහා ඇති ඉඩම

සීඊ2 : (ඒ) එය නැගෙනහිර පැත්ත දිගේ ඉඩම සහ විවෘත අවකාශයයි
(බී) වාතාශ්‍රය සඳහා විවෘත අවකාශය
(සී) සියලුම සහාධිපත්‍ය කොටස් සඳහා පොදුවේ පාවිච්චි කිරීම සඳහා වන ඉඩම

සීඊ3 : (ඒ) එය මධ්‍යයේ පිහිටි ඉඩම සහ විවෘත අවකාශයයි
(බී) වාතාශ්‍රය සඳහා විවෘත අවකාශය
(සී) සියලුම සහාධිපත්‍ය කොටස් සඳහා පොදුවේ පාවිච්චි කිරීම සඳහා වන ඉඩම

සීඊ4 : (ඒ) එය නැගෙනහිර පැත්ත දිගේ ඉඩම සහ විවෘත අවකාශයයි
(බී) වාතාශ්‍රය සඳහා විවෘත අවකාශය
(සී) සියලුම සහාධිපත්‍ය කොටස් සඳහා පොදුවේ පාවිච්චි කිරීම සඳහා වන ඉඩම

සීඊ5 : (ඒ) එය පසුපස ඉඩම සහ විවෘත අවකාශයයි
(බී) වාතාශ්‍රය සඳහා විවෘත අවකාශය
(සී) වාහන ගාල් කිරීම සඳහා සියලුම සහාධිපත්‍ය කොටස් සඳහා පොදුවේ පාවිච්චි කිරීම සඳහා වන ඉඩම

සීඊ6 : (ඒ) එය බස්නාහිර පැත්ත දිගේ ඉඩම සහ විවෘත අවකාශයයි
(බී) වාතාශ්‍රය සඳහා විවෘත අවකාශය
(සී) සියලුම සහාධිපත්‍ය කොටස් සඳහා පොදුවේ පාවිච්චි කිරීම සඳහා වන ඉඩම

සීඊ7 : (ඒ) එය බස්නාහිර පැත්ත දිගේ ඉඩම සහ විවෘත අවකාශයයි
(බී) වාතාශ්‍රය සඳහා විවෘත අවකාශය
(සී) සියලුම සහාධිපත්‍ය කොටස් සඳහා පොදුවේ පාවිච්චි කිරීම සඳහා වන ඉඩම

සීඊ8 : (ඒ) එය නළයකි (Duct)
(බී) එය පොදුවේ පාවිච්චි කිරීම සඳහාය

සීඊ9 : (ඒ) එය බිම් මහලේ පොම්පාගාරයකි
(බී) එය පොදුවේ පාවිච්චි කිරීම සඳහාය

සීඊ10 : (ඒ) එය බිම් මහලේ කුණු කසළ එක් රැස්කරන ස්ථානයකි
(බී) එය පොදුවේ පාවිච්චි කිරීම සඳහාය

සීඊ11 : (ඒ) එය බිම් මහලේ විදුලිජනක කාමරයයි
(බී) එය පොදුවේ පාවිච්චි කිරීම සඳහාය

සීඊ12 : (ඒ) එය බිම් මහලේ ආබාධිත වැසිකිළියයි
(බී) එය පොදුවේ පාවිච්චි කිරීම සඳහා

සීඊ13 : (ඒ) එය වරිපනම් අංක 1 නිමල් පාර දරන බිම් මහලේ ආවරණය කරන ලද ප්‍රදේශයයි
(බී) වාහන පැදවීම සහ ගාල් කිරීම සඳහා එය සියලුම සහාධිපතය කොටස් සඳහා පොදුවේ පාවිච්චි කිරීම සඳහායි

සීඊ14 : (ඒ) එය සියලුම මහල් දිගේ දිවෙන පඩිපෙළයි
(බී) එය පොදුවේ පාවිච්චි කිරීම සඳහායි

සීඊ15 : (ඒ) එය සියලුම මහල්දිගේ දිවෙන සෝපානය
(බී) එය පොදුවේ පාවිච්චි කිරීම සඳහායි

සීඊ16 : (ඒ) එය පළමු මහලේ සෝපානය ඉදිරියේ ඇති නිදහස් අවකාශයයි
(බී) එය පොදුවේ පාවිච්චි කිරීම සඳහායි
(සී) එය එෆ්1පී1 සහ එෆ්1පී2 දරන සහාධිපත්‍ය ඒකක සඳහා ඉක්මනින් ප්‍රවේශ වියහැකි පොදු ප්‍රදේශයයි

සීඊ17 : (ඒ) එය දෙවන මහලේ සෝපානය ඉදිරියේ ඇති නිදහස් අවකාශයයි
(බී) එය පොදුවේ පාවිච්චි කිරීම සඳහා
(සී) එය එෆ්2පී1 සහ එෆ්2පී2 දරන සහාධිපත්‍ය ඒකක සඳහා ඉක්මනින් ප්‍රවේශ විය හැකි පොදු ප්‍රදේශයයි

සීඊ18 : (ඒ) එය තුන්වන මහලේ සෝපානය ඉදිරියේ ඇති නිදහස් අවකාශයයි
(බී) එය පොදුවේ පාවිච්චි කිරීම සඳහායි
(සී) එය එෆ්3පී1 සහ එෆ්3පී2 දරන සහාධිපත්‍ය ඒකක සඳහා ඉක්මනින් ප්‍රවේශ වියහැකි පොදු ප්‍රදේශයයි

සීඊ19 : (ඒ) එය හතරවන මහලේ සෝපානය ඉදිරියේ ඇති නිදහස් අවකාශයයි
(බී) එය පොදුවේ පාවිච්චි කිරීම සඳහායි
(සී) එය එෆ්4පී1 සහ එෆ්4පී2 දරන සහාධිපත්‍ය සඳහා ඉක්මනින් ප්‍රවේශ වියහැකි පොදු ප්‍රදේශයයි

සීඊ20 : (ඒ) එය පස්වන මහලේ සෝපානය ඉදිරියේ ඇති නිදහස් අවකාශයයි
(බී) එය පොදුවේ පාවිච්චි කිරීම සඳහායි
(සී) එය එෆ්5පී1 සහ එෆ්5පී2 දරන සහාධිපත්‍ය ඒකක සඳහා ඉක්මනින් ප්‍රවේශ වියහැකි පොදු ප්‍රදේශයයි

සීඊ21 : (ඒ) එය ඉහළම තට්ටුවේ ටෙරසයේ සෝපානය ඉදිරියේ ඇති නිදහස් අවකාශයයි
(බී) එය පොදුවේ පාවිච්චි කිරීම සඳහා

සීඊ22 : (ඒ) එය ගොඩනැගිල්ලේ ඉහළ පිහිටි ඉහළම තට්ටුවේ ටෙරසයයි
(බී) එය පොදුවේ පාවිච්චි කිරීම සඳහා

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නීති)/
මණ්ඩලික ලේකම්.

08 - 657/1

---

**හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - ජාඇල ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතයයි

ගැවින් ස්ටීව් රොමාරියෝ ඩයස්.

2020 මාර්තු මස 04 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමකදී පහත දැක්වෙන පරිදි විශේෂයෙන් හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් අනිකුත් පහසුකම් අතර ඔබ වෙත ප්‍රදානය කරන ලද වාරික ණය පහසුකම මත පමණක් ගෙවීම් කිරීම සඳහා සුරක්ෂිතයක් වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට, ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. ඒකනායක විසින් ලියා සහතික කරන ලද අංක 13815 හා 2018.08.09 වැනි දින දරන උකස් බැඳුම්කරය මගින් මෙහි පළමුවන උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපල ගැවින් ස්ටීව් රොමාරියෝ ඩයස් විසින් ණයකරු වශයෙන් උකස්කර තිබේ.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් අනිකුත් පහසුකම් අතර ඔබ වෙත ප්‍රදානය කරන ලද එකී වාරික ණය පහසුකම

ගෙවීම සඳහා සුරක්ෂිතයක් වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට, ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. ඒකනායක විසින් ලියා සහතික කරන ලද අංක 13816 හා 2018.08.09 වැනි දින දරන උකස් බැඳුම්කරය මගින් මෙහි දෙවන උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ එකී ගැවින් ස්ටීව් රොමාරියෝ ඩයස් විසින් ණයකරු වශයෙන් උකස්කර තිබේ.

ඒ අනුව එකී බැඳුම්කර මත දැන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත 2019.11.20 වැනි දිනට රු. 15,996,782.71 (රුපියල් මිලියන පහළොවයි නම ලක්ෂ අනූ හය දහස් හත්සිය අසූ දෙකයි ශත හැත්තෑ එකක) මුදලක් පමණක් ගෙවිය යුතුව සහ අයවිය යුතුව ඇති අතර, ඒ අනුව 2019.11.21 වැනි දින සිට විකුණුම් දිනය දක්වා තවදුරටත් පොළියද සමග 2019.11.20 වැනි දිනට අයවිය යුතු එකී රු. 15,996,782.71ක මුදල සහ ප්‍රචාරණ පිරිවැය සහ එතෙක් ගෙවා ඇති යම් මුදලක් (ඇත්නම්) අඩුකොට අයකර ගැනීම සඳහා එකී අංක 13815 සහ 13816 දරන බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස්කරන ලද සහ මෙහි පළමුවන සහ දෙවන උපලේඛනවල සවිස්තරව දක්වා ඇති දේපළ, මුළු දිවයිනටම බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙමගින් යෝජනා සම්මත කර ගනී.

### පළමුවන උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දාසිය පත්තුවේ අලුත්කුරු කෝරළේ, කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සහ කටුනායක-සීදුව නගර සභා සීමාව තුළ ලියනගේමුල්ල උතුර, අංක 144ඒ ග්‍රාම නිලධාරි වසම තුල ලියනගේමුල්ලේ පිහිටි "දවටගහවත්ත, දවටගහකුරුඳුවත්ත හෙවත් බෝවලමුහන්දිරම්ගේවත්ත" නමැති ඉඩමට බයලත් මිනින්දෝරු කේ. ඩී. ජී. වීරසිංහ විසින් සාදන ලද අංක 2194 හා 2002 පෙබරවාරි 17 වැනි දින දරන පිඹුරේ ලොට් 35 වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : මෙහි ලොට් 37 සහ 32 ද, නැගෙනහිරට : මෙහි ලොට් 34 ද, දකුණට : මෙහි ලොට් 224 සහ බස්නාහිරට : මෙහි ලොට් 36 ද මායිම් වූ එකී අංක 2194 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දහහතරයි දශම තුනයි නමයක (අ. 0, රූ. 0, පර්. 14.39) විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි සහ සෑම සියලු දේත් වේ.

ඉහත කී අංක 2194 දරන පිඹුරේ ලොට් 224, ලොට් 223 දරන මතින් මාර්ග අයිතිය සමග වේ.

### දෙවන උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, දාසිය පත්තුවේ කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සහ කටුනායක-සීදුව නගර සභා සීමාව තුළ ලියනගේමුල්ල උතුර, අංක 144ඒ ග්‍රාම නිලධාරි වසම තුල ලියනගේමුල්ලේ පිහිටි "දවටගහවත්ත, දවටගහකුරුඳුවත්ත හෙවත් බෝවලමුහන්දිරම්ගේවත්ත" නමැති ඉඩමට බයලත් මිනින්දෝරු කේ. ඩී. ජී. වීරසිංහ විසින් සාදන ලද අංක 2194 හා 2002 පෙබරවාරි 17 වැනි දින දරන පිඹුරේ ලොට් 34 වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : මෙහි ලොට් 32 ද, නැගෙනහිරට : මෙහි ලොට් 33 ද, දකුණට : මෙහි ලොට් 224 සහ බස්නාහිරට : මෙහි ලොට් 35 ද මායිම් වූ එකී අංක 2194 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දහහතරයි දශම තුනයි නමයක (අ. 0, රූ. 0, පර්. 14.39) විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි සහ සෑම සියලු දේත් වේ.

අංක 2194 දරන පිඹුරේ ලොට් 224, ලොට් 223 මතින් මාර්ග අයිතිය සහ අංක 2194 දරන පිඹුරේ දැක්වෙන කාණු ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නීති)/
මාණ්ඩලික ලේකම්.

08 - 657/2

---

## මහජන බැංකුව

### අයකිරීම් - ආයතනික බැංකු අංශය

### 1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 වන (ඇ) වගන්තිය යටතේ වූ යෝජනා සම්මතයයි

1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 (ඇ) වගන්තිය යටතේ 2019.09.30 වැනි දින පවත්වන ලද මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරනු ලැබූ බවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

2007 වර්ෂයේ අංක 07 දරන සමාගම් පනත යටතේ නිසි පරිදි සංස්ථාපනය කරන ලද අංක PV 17448 ලියාපදිංචි අංකය දරන ගම්පොල, දුම්රියපල පාරේ, අංක 37/3/C, ලිපිනයේ ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යනු ලබන සමාගමක් වන සරු ඉන්ටර්නැෂනල් (පුද්) සමාගම, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් දේවිකා එස්. මහවත්ත විසින් 2015 නොවැම්බර් මස 16 වැනි දින සහතික කරන ලද අංක 508 දරන උකස් ඔප්පුව මත ආපසු ගෙවීමට බැඳී ඇති සහ නියමිතව ඇති මුදල් නොගෙවා පැහැර හැරීම හේතුවෙන් අදාළ පොලී මුදල් ද සමග රුපියල් විසි මිලියන පන් දහස් තුනයි ශත අසූ අටක් (රු. 20,005,003.88) සහ ඇමෙරිකානු ඩොලර් අසූ හය දහස් එකසිය තිස් හතයි ශත දෙකක් (ඇ.ඩො. 86,137..02) එකී ඔප්පුව මත මහජන බැංකුව වෙත දැනට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇත.

තව ද මෙහි උපලේඛනයෙහි වඩාත් සවිස්තරාත්මකව දක්වා ඇති කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් දේවිකා එස්. මහවත්ත මහත්මිය විසින් 2015 නොවැම්බර් මස 16 වැනි දින සහතික කරන ලද අංක 508 දරන උකස් ඔප්පුව මගින් එකී මහජන බැංකුවට උකස් තබන ලද දේපල හා පරිශ්‍රය වෙනුවෙන් මහජන බැංකුව වෙත ගෙවීමට හිඟව පවතින ඉහත කී රුපියල් විසි මිලියන පන් දහස් තුනයි ශත අසූ අටක් (රු. 20,005,003.88) මුදලක් සහ රුපියල් පහළොස් මිලියන තුන්ලක්ෂ අසූහය දහසක් (රු. 15,386,000) සඳහා 2019 ජූලි මස 23 වැනි දින සිට වර්ෂයකට සියයට දහතුනයි දශම පහක් (13.5%) බැගින් අයවිය යුතු පොළිය ද, සමග සහ ඇමෙරිකානු ඩොලර් අසූ හය දහස් එකසිය තිස් හතයි ශත දෙකක (ඇ.ඩො. 86,137.02 මුදලක් සහ, ඇමරිකානු ඩොලර් හැත්තෑ තුන් දහස් එකසිය හැට හයයි ශත තිස්නවයක් (ඇ.ඩො. 73,166.39) මුදල මත 2019 ජූලි මස 23 වැනි දින සිට වර්ෂයකට සියයට හයයි දශම පහක් (6.5%) බැගින් අයවිය යුතු පොළිය ද සමග සහ හෝ එහි සමාන ශ්‍රී ලංකා රුපියල් අගය, විකිණීම් පිරිවැය සහ මහජන බැංකු පනතේ අංක 29 (ඕ) වගන්තිය ප්‍රකාරව අයකරගත හැකි මුදල්, යම් මුදලක් ගෙවා ඇත්නම් අඩුකොට අයකර ගැනීම සඳහා කොට්ටාව, බංගලාවත්ත, ප්‍රගති මාවත, අංක 61/1හි බලයලත් වෙන්දේසිකරු හේමචන්ද්‍ර දළුවත්ත විසින් ප්‍රසිද්ධ වෙන්දේසියක දී විකුණනු ලැබිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතින් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරලේ, අදිකාරි පත්තුවේ, බියගම ප්‍රාදේශීය සභාවේ, බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 282, කඳුබොඩ ග්‍රාම නිලධාරී වසමේ කඳුබොඩ පිහිටි "කරදගොල්ලවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. කේ. මහින්ද විසින් 2014 සැප්තැම්බර් මස 03 වැනි දින මැන සාදන ලද අංක 5881 දරන පිඹුරේ ලොට් A ලෙස සඳහන් බෙදා වෙන් කරන ලද කොටසට මායිම්, උතුරට : පාර සහ මීටර් 4.5ක් පළල කාණුව (අංක 4888 දරන පිඹුරේ ලොට් 4) සහ අංක 4888 පිඹුරේ ලොට් 25 ද, නැගෙනහිරට : අංක 4888 පිඹුරේ ලොට් 25, 24 සහ 30 ද, දකුණට : අංක 4888 පිඹුරේ ලොට් 30, 29 සහ 28 ද සහ බස්නාහිරට : අංක 4888 පිඹුරේ ලොට් 28 සහ 1 සහ පාර සහ මීටර් 4.5ක් පළල කාණුව (අංක 4888 දරන පිඹුරේ ලොට් 4) මායිම් වන පර්චස් විස්සයි දශම හතරයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 20.40) හෝ හෙක්ටයාර් 0.05160ක වපසරියක් සහිත ඉඩම, ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ සහ එහි පවත්නා අනෙකුත් සියලු දේ සමග වේ. මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ N 247/101 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත අංක 5881 දරන පිඹුරේ ලොට් අංක A පහත සඳහන් ඉඩම් නැවත මැන ඒකාබද්ධ කිරීමකි.

1. ඉහත කී කඳුබොඩ පිහිටි "කරදගොල්ලවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. කේ. මහින්ද විසින් 2012 අප්‍රේල් මස 04 වැනි දින මැන සාදන ලද අංක 4888 දරන පිඹුරේ ලොට් 26 ලෙස සඳහන් බෙදා වෙන් කරන ලද කොටසට මායිම්, උතුරට : මෙම පිඹුරේ ලොට් 4 සහ 25 ද, නැගෙනහිරට : මෙම පිඹුරේ ලොට් 25 සහ 24 ද, දකුණට : මෙම පිඹුරේ ලොට් 30, 29 සහ 27 ද සහ බස්නාහිරට : මෙම පිඹුරේ ලොට් 27 සහ 4 ද මායිම් වන පර්චස් දහයයි දශම දෙකයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 10.20) සහිත ඉඩම වේ. මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ N 156/40 යටතේ ලියාපදිංචි කර ඇත.

2. ඉහත කී කඳුබොඩ පිහිටි "කරදගොල්ලවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. කේ. මහින්ද විසින් 2012 අප්‍රේල් මස 04 වැනි දින මැන සාදන ලද අංක 4888 දරන පිඹුරේ ලොට් 27 ලෙස සඳහන් බෙදා වෙන් කරන ලද කොටසට මායිම්, උතුරට : මෙම පිඹුරේ ලොට් 1, 4 සහ 26 ද, නැගෙනහිරට : මෙම පිඹුරේ ලොට් 26 සහ 29 ද, දකුණට : මෙම පිඹුරේ ලොට් 29 සහ 28 ද සහ බස්නාහිරට : මෙම පිඹුරේ ලොට් 28 සහ 1 ද මායිම් වන පර්චස් දහයයි දශම දෙකයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 10.20) සහිත ඉඩම වේ. මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ N 156/41 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

*වැ.බ. සහකාර සාමාන්‍යාධිකාරී.*
(අයකිරීම්)

2019 ජූලි මස 31 වැනි දින,
මහජන බැංකුව,
අයකිරීම් දෙපාර්තමේන්තුව,
10 වන මහල, ප්‍රධාන කාර්යාලය,
අංක 75, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත,
කොළඹ 02.

08 - 666

---

### සණස සංවර්ධන බැංකුව පී.එල්.සී - අම්බලන්තොට ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සණස සංවර්ධන බැංකුව පී.එල්.සී හි (ලියාපදිංචි අංකය පී.බී. 62 පී.කිව්) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම : 2400195.
සමරසිංහ ගමාච්චිගේ පියදාස මහතා.
පත්මා වන්නි ආරච්චි කංකානම්ගේ හෙවත් පද්මා වන්නිආරච්චි හෙවත් වන්නි ආරච්චි කංකානම්ගේ පද්මා මහත්මිය.
සමරසිංහ ගමගේ දියනා හසිනි හෙවත් සමරසිංහ ගමගේ දියන් හසිනි මහත්මිය.

2019 දෙසැම්බර් මස 18 වැනි දින පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී සණස සංවර්ධන බැංකුව පී.එල්.සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් හා ඒකඡන්දයෙන් මෙසේ නිශ්චය කරන ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. ඩබ්. සී. තුෂාරි විසින් 2019.04.02 වැනි දින සහතික කරන ලද අංක 410 දරන සණස සංවර්ධන බැංකුව පී.එල්.සී නමට ලියන ලද්දා වූ ද උකස් බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම (01) සමරසිංහ ගමාච්චිගේ පියදාස මහතා, (02) පත්මා වන්නි ආරච්චි කංකානම්ගේ හෙවත් පද්මා වන්නිආරච්චි හෙවත් වන්නි ආරච්චි කංකානම්ගේ පද්මා මහත්මිය, (03) සමරසිංහ ගමගේ දියනා හසිනි හෙවත් සමරසිංහ ගමගේ දියන් හසිනි මහත්මිය ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් මිලියන තිහයි දෙලක්ෂ හැත්තෑ නව දහස් අටසිය තුනයි ශත හැට හතරක (රු. 30,279,803.64) මුදලක් 2019 සැප්තැම්බර් මස 06 වැනි දින වන විට සණස සංවර්ධන බැංකුව පී.එල්.සී හට දැන් අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 30,279,803.64) මුදල අයකර ගැනීම සඳහා සහ 2019 සැප්තැම්බර් මස 07 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තාවූ යම් මුදලක් වේ නම් ඒවා ද අඩු කොට එකී අංක 410 දරන උකස් බැඳුම්කරය මගින් සණස සංවර්ධන බැංකුව පී.එල්.සී හට උකස් කොට ඇත්තාවූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ 12, හල්ෆ්ස්ට්ස්ඩෝප් වීදියේ, 2 වන මහලේ, අංක 200 දරන ස්ථානයේ බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි සංශෝධිත 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ සණස සංවර්ධන බැංකුව පී.එල්.සී හි අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, නුවර දිස්ත්‍රික්කයේ, නුවර මහ නගර සභා සීමාව සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත දොඩංවල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ (වඩාත් නිවැරදිව නුවර දොඩංවල ලෙස) දොඩංවල ගමේ පිහිටි වරිපනම් අංක 51/6, දරන "ගල්කන්ද එස්ටේට්" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. එස්. බී. සාගරන්දෙනිය විසින් 2015.06.18 වැනි දින මැන පිළියෙල කරන ලන අංක 1270 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 06 වශයෙන් දක්වෙන ඉඩම් කොටසට මායිම් පහත පරිදි වේ. උතුරට : අංක 1270 දරන පිඹුරේ ලොට් 7 මගින් ද, නැගෙනහිරට : අංක 1270 දරන පිඹුරේ ලොට් 8 මගින් ද, දකුණට : දොඩංවල දක්වා රිවර් ඩේල් පාර මගින් ද, බස්නාහිරට : අංක 1270 දරන පිඹුරේ ලොට් 5 මගින් ද මායිම් වූ පිඹුර ප්‍රකාරව රූඩ් තුනයි පර්චස් පහළොවයි දශම දෙකක (අ. 0, රූ. 3, පර්. 15.2) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය නුවර ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ A 164/125 යටතේ ලියාපදිංචි කර ඇත.

මණ්ඩලයේ නියමය මගින්,

සමාගම් ලේකම්,

08 - 589

---

## සණස සංවර්ධන බැංකුව පී.එල්.සී - ගාල්ල ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සණස සංවර්ධන බැංකුව පී.එල්.සී හි (ලියාපදිංචි අංකය පී.බී. 62 පී.කිව්) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම : 2197668.
පුස්වැල්ල හේවගේ අනුර මහතා, පුස්සේවෙල හේවගේ රශ්මි හිරුණිකා මහත්මිය.

2020 ජූලි මස 24 වැනි දින පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී සණස සංවර්ධන බැංකුව පී.එල්.සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් හා ඒකඡන්දයෙන් මෙසේ නිශ්චය කරන ලදී.

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් පී. රනෝජිනි යූ. ගමගේ විසින් 2018.03.28 වැනි දින සහතික කරන ලද අංක 1800 දරන සණස සංවර්ධන බැංකුව පී.එල්.සී නමට ලියන ලද්දා වූ ද උකස් බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම (01) පුස්වැල්ල හේවගේ අනුර මහතා සහ (02) පුස්සේවෙල හේවගේ රශ්මි හිරුණිකා මහත්මිය ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් මිලියන පහයි පන් ලක්ෂ අසූ හත් දහස් හාරසිය පනස් පහයි ශත හතළිස් අටක (රු. 5,587,455.48) මුදලක් 2019 ඔක්තෝබර් මස 15 වැනි දින වන විට සණස සංවර්ධන බැංකුව පී.එල්.සී හට දැන් අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 5,587,455.48ක මුදල අයකර ගැනීම සඳහා සහ 2019 ඔක්තෝබර් මස 16 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තාවූ යම් මුදලක් වේ නම් ඒවා ද අඩු කොට එකී අංක 1800 දරන උකස් බැඳුම්කරය මගින් සණස සංවර්ධන බැංකුව පී.එල්.සී හට උකස් කොට ඇත්තාවූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ 12, හල්ෆ්ට්ස්ඩෝප් වීදියේ, 2 වන මහලේ, අංක 200 දරන ස්ථානයේ බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි සංශෝධිත පරිදි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ සණස සංවර්ධන බැංකුව පී.එල්.සී හි අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

### උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, බෝපේ පෝද්දල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කිතුලම්පිටිය දකුණ - 124 ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කිතුලම්පිටිය ගමේ හි පිහිටි "ගල්කැටියගොඩ කන්ද" නමැති ඉඩමේ ඒකාබද්ධ කරන ලද ලොට් 1 හි ලොට් 1 සහ ලොට් 2 හි ලොට් 2B ට බලයලත් මිනින්දෝරු කේ. ඩබ්. පතිරන විසින් 2007.01.22 වැනි දින මැන පිළියෙල කරන ලද අංක 4075 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් A වශයෙන් දක්වෙන ඉඩම් කොටසට මායිම් පහත පරිදි වේ. උතුරට : එම ඉඩමේ කොටස මගින් ද, නැගෙනහිරට : එම ඉඩමේ ලොට් 4, 2 සහ 6 මගින් ද,

දකුණට : එම ඉඩමේ කොටස මගින් ද, බස්නාහිරට : එම ඉඩමේ කොටස මගින් ද, මායිම් වූ පිඹුර ප්‍රකාරව රූඩ් එකයි පර්චස් දාහතයි දශම හයයි දෙකක (අ. 0, රූ. 1, පර්. 17.62) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ R 43/40 යටතේ ලියාපදිංචි කර ඇත.

බලයලත් මිනින්දෝරු ඒ. එන්. ඩබ්. ලියනගේ විසින් 2018.01.17 වැනි දින නැවත මැන පිළියෙල කරන ලද අංක 5113 දරන පිඹුර ප්‍රකාරව ඉඩම පහත පරිදි විස්තර කර ඇත.

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, බෝපේ පෝද්දල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කිතුලම්පිටිය දකුණ - 124 ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, කිතුලම්පිටිය ගමේ හි පිහිටි වරිපනම් අංක 112/32A සහ 112/32B දරන "ගල්කැටියගොඩ කන්ද" නමැති ඉඩමේ ඒකාබද්ධ කරන ලද ලොට් 1 හි ලොට් 1 සහ ලොට් 2හි ලොට් 2B ට බලයලත් මිනින්දෝරු ඒ. එන්. ඩබ්. ලියනගේ විසින් 2018.01.17 වැනි දින මැන පිළියෙල කරන ලද අංක 5113 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් A වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් පහත පරිදි වේ. උතුරට : එම ඉඩමේ කොටස මගින් ද. නැගෙනහිරට : එම ඉඩමේ ලොට් 4 සහ P.S. පාර මගින් ද, දකුණට සහ බස්නාහිරට : එම ඉඩමේ කොටස මගින් ද මායිම් වූ පිඹුර ප්‍රකාරව රූඩ් එකයි පර්චස් දාහතයි දශම හයයි දෙකක (අ. 0, රූ. 1, පර්. 17.62) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

මණ්ඩලයේ නියමය මගින්,

සමාගම් ලේකම්,

08 - 590

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.